# ඉතිහාසය කැත කළ සීගිරියේ කෑවී පැල්ලම





**සීගිරි බිතු සිතුවම්වල තාර ගා දැමීමේ සිද්ධියට අදට (14) වසර 55කි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**

1967 ඔක්. 14 වැනිදා රාත්‍රියේ සිදුකළ මේ මහා ජාතික විනාශය පිළිබඳ ඇසූ එවක ආචාර්ය සෙනරත් පරණවිතාන පඬිවරයාගේ දෑසට කඳුළු නැඟුණු බව ද ඉතා ප්‍රකට කරුණකි. ඒ කාලයේදී සංස්කෘතික හා අධ්‍යාපන අමාත්‍යාංශය භාරව සිටියේ ඉතා ප්‍රකට සාහිත්‍යධරයකු වූ අයි.ඇම්. ආර්.ඒ. ඊරියගොල්ල මහතාය. එම අමාත්‍යාංශයේ ලේකම්වරයා වූයේද ඉතා ප්‍රකට සාහිත්‍යධරයකු මෙන්ම පරිපාලන ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු වූ ඇම්.ජේ. පෙරේරා මහතාය. කිසිවකු හෝ කිසියම් කණ්ඩායමක් විසින් විනාශ කරන ලද බිතු සිතුවම් තහවුරු කිරීම පිණිස ලොව හොඳම විශේෂඥවරයාගේ සේවය ලබාදෙන ලෙස ඊරියගොල්ල අමාත්‍යවරයා රෝමයේ සංස්කෘතික වස්තු හැදෑරීමේ සහ සංරක්ෂණය කිරීමේ අන්තර්ජාතික මධ්‍යස්ථානයෙන් ඉල්ලීමේ ප්‍රතිඵලයක් ලෙස ඉතාලි ජාතික ලුසියානෝ මරාන්සි මහතා 1967 ඔක්. 22 වැනිදා ලංකාවට එවනු ලැබීය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග පසුදිනම සීගිරියට ගිය ලුසියානෝ මරාන්සි මහතා තමා විසින් ගෙන එන ලද රසායනික ද්‍රව්‍ය යොදා සංරක්ෂණ කටයුතු ආරම්භ කළේය.

මෙම සීගිරි බිතු සිතුවම් විනාශය පිළිබඳ වාර්තා කිරීම පිණිස එදා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ පසුව සිංහලසේවා අධ්‍යක්ෂවරයා වූ පාලිත පෙරේරා මහතා ලුසියානෝ මරාන්සි මහතා සමග කතා කළ අවස්ථාවේ ඔහු ප්‍රකාශ කර ඇත්තේ මේ තරම් සංවේදී



ඉතා වැදගත් ශිෂ්ටාචාරයකින් පැවත එන ඔබේ රටේ මිනිසුන් ඇයි මෙහෙම ජාතික විනාශයක් සිදු කළේ යනුවෙනි.

වසර දහස් ගණනක් තිස්සේ අමිල ජාතික දායාදයක් වූ සීගිරි බිතු සිතුවම් මත තීන්ත ගෑවේ කව්රුන්දැයි අපි තවමත් නොදනිමු.

විනාශ කර තිබූ සීගිරි බිතුසිතුවම් සංරක්ෂණය කිරීමේ කටයුතු ඉතාලි ජාතික ලුසියානෝ මරාන්සි මහතා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග (ආචාර්ය රාජා ද සිල්වා මහතා ඇතුළු) බිතු සිතුවම් මත තවරා තිබූ සායම් ඉවත් කරමින් ආරම්භ කළේය.

අද ඔබ සීගිරියට ගිය පසුව සීගිරි ලලනියන් දකින්නට ලැබෙන්නේ එදා එනම් මීට වසර පනස් පහකට ඉහතදී ජාතිද්‍රෝහීන් විසින් කළ විනාශයට නිසි පිළියම් යෙදීමට ලුසියානෝ මරාන්සි මහතා මුල්වී ඒ කාර්ය ඉටු කළ නිසාය. විනාශ කළ බිතු සිතුවම් සංරක්ෂණය කිරීමේ කටයුතුවල මුල් අදියර නිම කළ ලුසියානෝ මරාන්සි මහතා 1967 නොවැම්බර් මාසයේ 4දා ආපසු ඉතාලියට ගියේය.

ඉන්පසු ඉතිරි සංරක්ෂණ කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ තහවුරු කිරීමේ කණ්ඩායම විසින් සිදුකරන ලදී. 1968 වර්ෂයේ මාර්තු මස ලුසියානෝ මරාන්සි මහතා නැවතත් ලංකාවට පැමිණ එම සංරක්ෂණ කටයුතු කිරීමේ යෙදුනේය.

1968 මැයි 9 වැනිදා සම්භාවනීය අමුත්තන්ද දහස් ගණන් රට වැසියනුත් ඉදිරියේදී සීගිරි පර්වතයෙන් බටහිර ප්‍රාන්තයේ ඇති පැරැණි රාජ සභාවේ පවත්වන ලද ඉතිහාසගත විය යුතු රැස්වීමකදී සංස්කෘතික හා අධ්‍යාපන අමාත්‍යතුමා වූ අයි.එම්. ආර්.ඒ. ඊරියගොල්ල මහතා විසින් බිතුසිතුවම් ගුහාව උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබීය. එවක හිටපු පුරාවිද්‍යා කොමසාරිස්වරයා වූ සී.ඊ. ගොඩකුඹුර මහතාගේ සේවා කාලය 1967 නොවැම්බර් 5 වැනිදයින් අවසන් වූ පසුව එවක සහකාර කොමසාරිස් (රසඥ) වශයෙන් කටයුතු කළ ආචාර්ය ආර්.එච්. ද සිල්වා මහතා වැඩබලන පුරාවිද්‍යා කොමසාරිස් තනතුරට පත් විය.

**මහාචාර්ය සෙනරත් පරණවිතාන පදනමේ ලේකම්**

**සිරි සමන් විජේතුංග**